**ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

**------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1** **තත්ත්වාගණනය නොකළ මතය**

**----------------------------------**

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැකිය.

(ආ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් හතරක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුල උපයෝජනය කල පසු එම වැය විෂයයන්ගේ ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 52 සිට සියයට 92 අතර පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 150 ප්‍රකාර ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කල යුතු වීම. | අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය විසිනි. එම කටයුතු ඔවුන් විසින් සැලසුම් කළ පරිදි ඉටු නොවීම හා නවීකරණ කටයුතු ප්‍රමාදවීම නිසා වෙන් කළ මුදල් ප්‍රතිපාදන වැය කිරීම අපහසුවිය. |
| (ආ) | මූලික වියදම් ඇස්තමේන්තුවට සාපේක්ෂාව සංශෝධිත වියදම් ඇස්තමේන්තුවෙහි වැය විෂයන් 11 ක විචලතාවය සියයට සෘණ 150 සිට සියයට 94 අතර පරාසයක් විය. | - එම - | වැය විෂයයන් 08 ක අපේක්ෂා කල වියදමට වඩා වැඩි වියදමක් දැරීමට සිදුවීමත්, වැය විෂයයන් 03 ක අපේක්ෂා කල වියදමට වඩා අඩු වියදමක් දැරීමට සිදුවීමත් නිසා මූලික වියදම් ඇස්තමේන්තුවට සාපේක්ෂව සංශෝධිත වියදම් ඇස්තමේන්තුවෙහි විචලතාවයන් සිදුවී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ නව ණය ගිවිසුම් මගින් ඇ.එ.ජ.ඩො. මිලියන 2,004 ක අරමුදල් සපයා ගැනීමට අපේක්ෂා කර තිබුණද, 2018 | හැකිතාක් දුරට අපේක්ෂිත පරිදි ඉලක්ක ලගා කර ගැනීමට කටයුතු | ඔබගේ වාර්තාවේ සඳහන් කරුණු සත්‍ය වන අතර ඉතාමත් ප්‍රායෝගික වූ හා අපගේ විෂය පථයෙන් |

| | | |
|---|---|---|
| වර්ෂය තුළ ණය ගිවිසුම් 40 ක් සම්බන්ධව එළඹ තිබූ මූල්‍යායන එකඟතාවල වටිනාකම ඇ.එ.ජ.ඩො. මිලියන 1,242 ක් විය. ඒ අතර ලෝක බැංකුව, චීනය, ජපානය සහ කොරියාව යන රටවලින් ලබාගැනීමට අපේක්ෂිත අරමුදල් ප්‍රමාණය පිළිවෙලින් ඇ.එ.ජ.ඩො. මිලියන 200, 400, 500 හා 40 ක් වූ අතර 2018 වර්ෂය තුළ පිළිවෙලින් ඇ.එ.ජ.ඩො. මිලියන 104, 165,98 හා 22 ක අරමුදල් ලබා ගැනීමට හැකි වී තිබුණි. | කිරීම සුදුසු වේ. | ඔබ්බෙහි වූ දේශපාලන වෙනස්වීම්, නීතිමය ගැටළු හා ප්‍රතිපත්තිමය තීරණ වෙනස්වීම් වැනි කරුණු හේතුවෙන් 2018 වර්ෂයේ සැලසුම් කළ පරිදි ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි විය. |

(ආ) පහත සඳහන් ණය ගිවිසුම් සඳහා එළඹ සැලකිය යුතු කාලයක් ගතවී තිබුණද ඒ සම්බන්ධ ව්‍යාපෘති මේ දක්වාම ක්‍රියාත්මක වී නොතිබුණි.

| ණය අංකය | ව්‍යාපෘතියේ නම හා ණය ගිවිසුම අත්සන් කළ දිනය | | |
|---|---|---|---|
| 2014023 | භෞමික රූපවාහිණී සම්ප්‍රේෂණය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 2014.09.23 | ගිවිසුම් ගත වූ ව්‍යාපෘති ප්‍රමාද නොකර කඩිනමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | 2014 සැප්තැම්බර් 24 දින ව්‍යාපෘතිය සඳහා ණය ගිවිසුම අත්සන් කර තිබුණි. මෙතෙක් JICA ආයතනය ණය ගිවිසුම සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොමැත. |
| 2014039 | රුවන්වැල්ල ජලසැපයුම් ව්‍යාපෘතිය - 2014.12.30 | - එම - | අදාළ ණය ගිවිසුමට 2014 දෙසැම්බර් මස එළැඹිණි. ලංසුව, ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා ඉතා ඉහල අගයක් ගැනීම හේතුවෙන් දෙපාර්ශවය අතර අවසන් එකඟතාවයක් ඇතිවී නොමැත. |
| 2013052 | ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතාවය - | - එම - | මෙය පොළී රහිත ණයක් වන අතර ගැටළු කිසිවක් නොමැති ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට චීන තානාපති කාර්යාලය එකඟතාව බලාපොරොත්තුවෙන් සිටී. |
| | | - එම - | සාකච්ඡා වාර ගණනාවක් සිදුකර ඇතත් නිපුණතා |

| | | |
|---|---|---|
| 2014021 | නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (බී කොටස) – 2014.09.12 | සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාකාරකම් ඉටුකිරීම පිළිබඳව විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සෑහීමකට පත්වන තුරු අදාල මුදල් විධිමත් ලෙස උපයෝජනය නොවීය. |

**3.2** **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් ණය පහසුකම් 03 ක් යටතේ ලබාගෙන තිබූ අතර ණය අංක 2012033 යටතේ ලබාගත් ඇ.එ.ජ.ඩො.මිලියන 600 ක මුදල ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණයෙන් උපයෝජනය කර තිබුණි. ණය අංක 2012032 යටතේ ලබා ගෙන තිබූ දෙවන ණය පහසුකම වූ යුවාන් මිලියන 1000 ක මුදලින් 2018 දෙසැම්බර් 31 දින වනවිට යුවාන් මිලියන 381.5 ක් උපයෝජනය කර තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු තොරතුරු අනුව මුළු ණය මුදලම උපයෝජනය කිරීමේ අපේක්ෂාවක් වරාය අධිකාරියට නොමැතිවීම මත තෙවන ණය මුදල වන ඇ.එ.ජ.ඩො.මිලියන 51 ක මුදල බලාත්මක කර නොතිබුණි. කෙසේ වෙතත් අංක 2012032 යටතේ ලබාගත් ණය මුදල සඳහා 2018 වර්ෂය තුළ ණය පොළී ගෙවීමට අමතරව උපයෝජනය නොකළ ණය මුදල සඳහා යුවාන් මිලියන 3.25 ක් බැඳීම්ගත ගෙවීම්ද සිදුකර තිබුණි. | උපයෝජනය නොකල මුදල් මතද ගෙවීම් සිදුවන බැවින් ඒ පිළිබඳ දැඩි අවධානය යොමු කළ යුතු වීම. | ණය ගිවිසුමට අනුව, උපයෝජනය කල මුදලට ගෙවිය යුතු ණය පොලියට අමතරව උපයෝජනය නොකළ ණය මුදල මත වාර්ෂිකව 0.5% ක බැඳීම් ගත ගෙවීම් සිදුකළ යුතු හෙයින් 2018 වර්ෂය සඳහා යුවාන් මිලියන 3.25 ක බැඳීම්ගත ගෙවීම් සිදුකර ඇත. එසේම, 2019.05.31 වන දිනෙන් පසුව ණය මුදලෙහි උපයෝජනය නොකළ මුදල අවලංගු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මගින් ණය අංක 712-LK යටතේ කුඩා වැවිලි ව්‍යාවසායකයින් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා ලබාදුන් මූලික අත්තිකාරම් මුදලකින් උපයෝජනය නොකළ ඇ.එ.ජ.ඩො. 34,472/71 (XDR 21,818/17) ක මුදලක් 2018 සැප්තැම්බර් 04 දින නැවත ණය ලබාදුන් ආයතනය වෙත යවා තිබුණි. නමුත් මෙම ණය මුදල සඳහා ද සේවා ගාස්තු ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | - එම - | කුඩා වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ගිවිසුමෙහි සඳහන් පරිදි ගෙවා ඇත්තේ සේවා ගාස්තුව වූ 0.75% ක ප්‍රමාණයකි. මෙම ගිවිසුම යටතේ ලද අත්තිකාරම් මුදලින් ඉතිරි මුදල ආපසු ණය දෙන ආයතනය වෙත ප්‍රේෂණය කර ඇත. ආපසු ගෙවන මුදල මත ගෙවන සේවා ගාස්තු තීරණය කළ නොහැකි බැවින් හා ගිවිසුමට අනුව එය උපයෝජනයක් බැවින් එයට අදාලව ගෙවීම කළ යුතු වේ. |
| (ඇ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත ශ්‍රී ලංකාවට 2017 වර්ෂයේදී ලැබුණු විදේශීය ශිෂ්‍යත්ව හා පුහුණු අවස්ථා 439 න් (චීන ශිෂ්‍යත්ව හැර) අවස්ථා 132 ක් සඳහා ද, 2018 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා ලැබී තිබූ අවස්ථා 346 න් 82 ක් සඳහා ද ඉදිරිපත් කරන ලද අයදුම්පත් සියල්ලම ප්‍රතික්ෂේප වීම නිසා පුහුණු අවස්ථා රටට අහිමි වී තිබුණි. නාමයෝජනා ඉදිරිපත් නොවීම සහ අයදුම්පත් නොලැබීම මත 2017 වර්ෂයේ විදේශ ශිෂ්‍යත්ව හා විදේශ පුහුණු අවස්ථා 51 ක්ද, 2018 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා (චීන ශිෂ්‍යත්ව හැර) අවස්ථා 20 ක්ද අහිමි වී ඇත. කෙසේ වෙතත් කෙටිකාලීන හා දිගුකාලීන විදේශ පුහුණුවීම් හා ශිෂ්‍යත්ව සංඛ්‍යාව 2017 ට සාපේක්ෂව 2018 වර්ෂයේදී සියයට 13 ක වර්ධනයක් ලබාගෙන තිබුණි. (අයදුම්පත් නොලැබූ පාඨමාලාවන් සියල්ලම ද්විපාර්ශ්වික නොවන බව විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පවසා තිබීම ගැටළු සහිත වේ.) | ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට අවශ්‍ය පුහුණුවීම් හඳුනාගෙන මෙම ලැබෙන ශිෂ්‍යත්ව හා පුහුණු වැඩසටහන් සඳහා එම නිලධාරීන්ගෙන් කඩිනම්ව අයදුම්පත් ලබාගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම සහ අයදුම් කිරීමේදී සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමේ වැදගත්කම අවබෝධ කිරීම තුළින් මෙවැනි තත්ත්වයන් අවම කරගත හැකි බව විගණනයේ නිර්දේශ වේ. | සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ නිර්ණායකයන් සම්පූර්ණ නොකරන අවස්ථාවන්හිදී අප විසින් යවනු ලබන අයදුම්පත් සියල්ලම වුවද ඔවුන් විසින් ප්‍රතික්ෂේප කල හැක. තවද, අයදුම්පත් නොලැබූ පාඨමාලාවන් සියල්ලම ද්විපාර්ශ්වික පාඨමාලාවන් නොවේ. එම නිසා අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් අපගේ නිලධාරීන්ට අනිවාර්යෙන්ම එම ශිෂ්‍යත්වය හිමිවේ යැයි අදහස් නොවේ.<br>නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් තෝරා ගැනීමට අදාල චක්‍රලේඛය අනුව සිදුකල යුතු අතර නියමිත දිනට පෙර අයදුම්පත් අප වෙත එවීම අදාල අමාත්‍යාංශය සතු වගකීමක් වේ.<br>තවද 2016 වර්ෂයේ දී විදේශ ශිෂ්‍යත්ව 1230 ක්ද 2016 ට සාපේක්ෂව 2017 හා 2018 වර්ෂවල එය පිළිවෙලින් සියයට 24 ක හා සියයට 41 ක වර්ධනයක්ද කර ගැනීමෙන් දෙපාර්තමේන්තුව ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත.<br>එබැවින් වාර්තා කෙටුම්පතෙහි 3.1.2 සඳහා එකඟ විය නොහැකි බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 | චක්‍රලේඛයේ | විදේශ ප්‍රදාන සඳහා |

| | | |
|---|---|---|
| දරණ විදේශාධාර ගිණුම් තැබීමට අදාල රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කළ යුතු වේ. ඒ අනුව එසේ කටයුතු කලයුතු බව සියළුම රාජ්‍ය ආයතන හා ප්‍රදාන රටවල්/ ආයතන වෙත කිහිපවරක් දැනුම් දී තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව සතුව ඇත්තේ දෙපාර්තමේන්තුව හරහා ලැබෙන විදේශ ආධාර පිළිබඳ තොරතුරු පමණක් බව නිරීක්ෂණය විය. වෙනත් රාජ්‍ය ආයතන වෙත මෙවැනි ආධාර ලැබී තිබේද යන වග තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සතුව පවතින බව නිරීක්ෂණය නොවීය. නියදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, රාජ්‍ය ආයතන 03 ක් විසින් සමාලෝචිත වර්ෂය තුල රු.114,879,740 ක විදේශ ප්‍රදාන සෘජුවම අදාළ ආයතන වෙත ලබාගෙන තිබුණි. | දැක්වෙන උපදෙස් අනුව විදේශ ආධාර සම්බන්ධයෙන් අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. | අමාත්‍යාංශයක් විසින් අත්සන් කරනු ලබන්නේ නම්, එම ගිවිසුමේ පිටපතක් හා අදාළ ප්‍රතිලබ්ධීන්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත එවීම අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් සිදු කළ යුතුය. ඒ අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ප්‍රදායක ආයතනය/පුද්ගලයා වෙතින් එම ප්‍රතිලබ්ධී ලබාගෙන CSDRMS දත්ත පද්ධතියේ සටහන් කිරීම සිදු කරයි. එම දත්ත අනුව ඉදිරි වර්ෂ සඳහා ප්‍රදාන ලැබීම් පුරෝකථනය කරයි.<br>එලෙස සටහන් නොවන විදේශ ප්‍රදාන ව්‍යාපෘති ඇති බව නිරීක්ෂණය වූ විට එම ආයතන කැඳවා නිවැරදි ක්‍රමවේදය පිළිබඳ උපදෙස් ලබාදී ඇත. |

**3.3 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වත්කම් මිලදී ගැනීම්, වත්කම් ලබා ගැනීම් හා පරිහරණය කිරීම් සඳහා වූ නිශ්චිත අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දී ඇති බවක් නිරීක්ෂණය නොවීය. | ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන ආකාරයෙන් එක් එක් අංශ විසින් තම ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ වෙන් වෙන්ව පරිභෝජනය කිරීම හා තම අංශයට අයත් නොවන භාණ්ඩ අදාළ අංශවලට භාරදීම තුලින් සෑම අංශයකම සමීක්ෂණ කටයුතු පහසුවනවා සේම භාණ්ඩ සඳහා ආරක්ෂාවක් ද පවතිනු ඇති බව විගණනයේ නිර්දේශය වේ. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු සටහන් කර ගන්නා ලද අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| (ආ) | ඉන්වෙන්ට්‍රිගත විය යුතු සෑම භාණ්ඩයක්ම ඉන්වෙන්ට්‍රියට ඇතුලත් විය යුතු අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වයර් දිගු | - එම - | - එම - |

(wire code) සහ වැන් රථය සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟාකර ගැනීමට අවශ්‍ය ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ලඟාවිය යුතු සන්ධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා අවශ්‍ය වන දර්ශකද හඳුනා ගැනීමේ කටයුතු සිදුකර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් ණය ආධාර ලබාදෙන බොහෝ ව්‍යාපෘති සෞඛ්‍ය, බලශක්ති, ජලසම්පාදන, ආපදා කළමනාකරණ, කෘෂිකාර්මික, යටිතල පහසුකම් යනාදී ක්ෂේත්‍රවලට අයත් බැවින් සමස්ත රජයේ තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම කෙරෙහි ද අවධානය යොමු කර සැලසුම් සකස් කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කෙරේ අවධානය යොමු කිරීම සුදුසු වේ. | ‘‘තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගීතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම හා පුනර්ජීවනය’’ යන අරමුණ සපුරාලීම සඳහා දායකත්වය ලබාදීම අප දෙපාර්තමේන්තුව සෘජුව සම්බන්ධ වන තිරිසර සංවර්ධන අරමුණවේ.<br><br>ව්‍යාපෘති සඳහා ණය/ආධාර ලබා ගැනීමේ ක්‍රියාවලියේ දී බොහෝ විදේශීය සංවර්ධන පාර්ශවකරුවන් විසින් අදාළ ව්‍යාපෘති තුලින් තිරසර සංවර්ධන අරමුණු සපුරාලන්නේද යන්න ණය ලබාදීමේ නිර්ණායකයක් ලෙස සලකා බලනු ලබයි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 156 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 125 ක් විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 10 කින්, තෘතිය | අදාල පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය | නවක රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් අනුයුක්ත කිරීමේ දී දෙපාර්තමේන්තුවේ ද්විතියික මට්ටමේ පුරප්පාඩු අඩු කරගත හැකි විය. අනුමත කාර්ය මණ්ඩලය තුළ මාණ්ඩලික |

| | | |
|---|---|---|
| මට්ටමේ පුරප්පාඩු 02 කින්, ද්විතියික මට්ටමේ 07 කින් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 12 බැගින් සමස්ථ සේවක පුරප්පාඩු සංඛ්‍යාව 31 ක් වී තිබුණි. | කිරීමට කටයුතු කල යුතු වීම. | නිලධාරීන් බඳවා ගැනීම අවශ්‍යතාවයන් පවතින නමුත් නවීකරණය කිරීමේ දී කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවයෙන් 1/3 ක පමණ ප්‍රමාණයක් තවදුරටත් අහිමි වී ඇත. |
| (ආ) කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | මෙම වර්ෂයේ සිට ඒ අනුව කටයුතු කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් දෙන ලදි. |
| (ඇ) කාර්යමණ්ඩලය සතුව පවතින නිපුනතා හා පැවතිය යුතුව පවතින නිපුනතා අතර පරතරය හඳුනාගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබීම සහ ආයතනයට සුවිශේෂී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබීම. | - එම - | - එම - |
| (ඇ) මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික විය යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 125 ක ගෙන් සාමාජිකයන් 81 දෙනෙකු සඳහා පමණක් එනම් සියයට 65 ක් සඳහා දේශීය හා විදේශ පුහුණු අවස්ථා ලබා දී තිබුණි. | - එම - | ප්‍රමිතියකින් යුතු අවස්ථා අවම වීමත් , තිපාදන තත්ත්වයත්පවතින ප්‍රනිසා පුහුණු අවස්ථාවන් සීමා කිරීමට සිදුවිය. |